# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2214/56 - 2021 පෙබරවාරි මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2021.02.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය, 6 වන වගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මවිසින් පනවනු ලබන රෙගුලාසි.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 පෙබරවාරි මස 11 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි "2021 අංක 03 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි "ලෙස හඳුන්වනු ලැබේ.

2. 2021 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පළ කරන ලද අංක 2213/8 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මෙමගින් පරිච්ඡින්න කරනු ලැබේ. මෙමගින්, "2020 අංක 04 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි" පළ කරන ලද 2020 ජූලි මස 16 වැනි දිනැති අංක 2184/21 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* සහ"විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි" පළ කරන ලද 2017 නොවැම්බර් මස 09 වැනි දිනැති අංක 2044/40 දරන *අති විශේෂ ගැසට් පත්‍රයන්ට*, "2021 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි" පළ කරන ලද 2021 පෙබරවාරි මස 02 වැනි දිනැති අංක 2213/8 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් සිදුකරන ලද සංශෝධනවල කිසිදු බලපෑමකින් තොරව ක්‍රියාත්මක වන බැව් අදහස් වෙයි.

3. මෙම ගැසට් පත්‍රයේ නියමකර ඇති රෙගුලාසි අංක 4, 5, 6, 7 සහ 8 අදාළ වන්නේ නෞභාර පත්‍රයේ/ ගුවන්භාර පත්‍රයේ දිනය ලෙස 2021 පෙබරවාරි මස 11 වැනි දින හෝ එදිනට පසු දිනක් සඳහන් වූ භාණ්ඩ ආනයනය කිරීම් සඳහා පමණි.

4. උපලේඛන II හි දක්වා ඇති, හඳුනාගත් ආනයනික සෙරමික් භාණ්ඩ, (සංයෝජිත වර්ගීකරණ ශිර්ෂ 69.06 සහ 69.10 යටතේ වර්ගීකරණය කරන ලද) නෞභාර පත්‍රයේ හෝ ගුවන්භාර පත්‍රයේ සඳහන් දිනයේ සිට, විදේශීය සැපයුම්කරුගෙන් ලබා ගන්නා අවමය දින 180ක ණය පහසුකම හෝ වෙනත් ඕනෑම විදේශීය ණය පහසුකමක් මත, පමණක් ආනයනය කළ යුතුය.

5. සංශෝධිත, 2020 අංක 04 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පළ කරන ලද 2020 ජූලි මස 16 දිනැති අංක 2184/21 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* I උපලේඛනයේ සඳහන් වූ පහත සඳහන් සෙරමික් භාණ්ඩ සහ ඒවාට අනුරූපී සටහන් එම උපලේඛනයෙන් ඉවත්කර එම සෙරමික් භාණ්ඩ එකී *ගැසට් පත්‍රයේ* II උපලේඛනයට ඇතුළත් කරනු ලැබේ.

| | *I තීරුව සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය* | *II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III තීරුව විස්තරය* | *IV තීරුව ණය පදනම මත (C)* | |
|---|---|---|---|---|---|---|
| | | | | | *දින 90* | *දින 180* |
| | | | | | | |
| **250** | **69.06** | 6906.00.00 | | පිඟන් මැටි පයිප්ප, නළ වැස්ම, පීලි ද්‍රව්‍ය සහ පයිප්ප වැද්දුම් | | C |
| **251** | **69.10** | | | පිඟන් මැටි, සොරොච් බේසම්, සෝදන බේසම්, සෝදන බේසම්, පාදස්තල, නාන බඳුන්, බිඩේ, දිය වැසිකිළි තැටි, දෝරටැංකි, කැසිකිළි භාජන සහ ඒ හා සමාන සෞඛ්‍ය රක්ෂක සවි කරන ද්‍රව්‍ය. | | |
| | | 6910.10.00 | - | පෝසිලේන් හෝ චීන මැටිවලින් කළ: | | |
| | | 6910.10.10 | --- | උක්කුටික පෝච්චි | | C |
| | | 6910.10.90 | --- | අනෙකුත් | | C |
| | | 6910.90.00 | - | අනෙකුත්: | | |
| | | 6910.90.10 | --- | උක්කුටික පෝච්චි | | C |
| | | 6910.90.90 | --- | අනෙකුත් | | C |

6. සංශෝධිත, 2020 අංක 04 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පළ කරන ලද 2020 ජූලි මස 16 දිනැති අංක 2184/21 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* I උපලේඛනයට පහත සඳහන් භාණ්ඩ සහ ඒවාට අනුරූපී සටහන් මෙයින් ඇතුළත් කරනු ලැබේ.

| | *I තීරුව සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය* | *II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III තීරුව විස්තරය* | *IV තීරුව තාවකාලික අත්හිටුවීම (TS)* |
|---|---|---|---|---|---|
| **138** | **69.14** | | | අනෙකුත් පිඟන් මැටි භාණ්ඩ | |
| | | 6914.90.00 | - | අනෙකුත්: | |
| | | 6914.90.10 | --- | අත්කම් | TS |
| | | 6914.90.90 | --- | අනෙකුත් | TS |

7. සංශෝධිත, විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි පළ කරන ලද 2017 නොවැම්බර් මස 09 වැනි දිනැති අංක 2044/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ I උපලේඛනයේ දක්වන ලද පහත සඳහන් භාණ්ඩ සහ ඊට අනුරූපී සටහන් මෙයින් ඉවත් කරනු ලැබේ.

| | *I තීරුව සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය* | *II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III තීරුව විස්තරය* | *IV තීරුව ආනයන පාලන බලපත්‍ර (L)* |
|---|---|---|---|---|---|
| **242** | **62.11** | | | **ජව ඇඳුම් කට්ටල (ට්‍රැක් සූට්ස්) හිම මත ලිස්සන ඇඳුම් (ස්කී සූට්ස්) සහ පිහිනුම් ඇඳුම් ; අනෙකුත් ඇඟළුම්.** | |
| | | 6211.42.92 | –– | අනෙකුත්, සාරි | L |
| | | 6211.43.92 | –– | අනෙකුත්, සාරි | L |
| | | 6211.49.92 | –– | අනෙකුත්, සාරි | L |

8. සංශෝධිත, 2020 අංක 04 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පළ කරන ලද 2020 ජූලි මස 16 දිනැති අංක 2184/21 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ II උපලේඛනයට සඳහන් පහත සඳහන් භාණ්ඩ සහ ඒවාට අනුරූපී සටහන් මෙයින් ඇතුළත් කරනු ලැබේ.

| | *I තීරුව සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය* | *II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III තීරුව විස්තරය* | *IV තීරුව ණය පදනම මත (C)* | |
|---|---|---|---|---|---|---|
| | | | | | *දින 90* | *දින 180* |
| **252** | **62.11** | | | **ජව ඇඳුම් කට්ටල (ට්‍රැක්සූට්ස්) හිම මත ලිස්සන ඇඳුම් (ස්කීසූට්ස්) සහ පිහිනුම් ඇඳුම් ; අනෙකුත් ඇඟළුම්.** | | |
| | | 6211.42.92 | –– | අනෙකුත්, සාරි | C | |
| | | 6211.43.92 | –– | අනෙකුත්, සාරි | C | |
| | | 6211.49.92 | –– | අනෙකුත්, සාරි | C | |

03 - 16

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.